# සිංහල



## 3 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# පාඩම -  නාම පද වර්ග කරමු
# (ප්‍රාණවාචී / අප්‍රාණවාචී පද)

**ක්‍රියාකාරකම 1**

- **පහත සඳහන් කවිය තාලයට ගායනා කරන්න. අවශ්‍ය නම් පවුලේ වැඩිහිටියෙකු ගේ ද සහාය ලබාගන්න.**

අපේ වත්තේ ජම්බු ගසේ
ගෙඩි ඉදිලා රතු පාටයි
ලේන් පැටියා ජම්බු ගසේ
අතු අග සිට ජම්බු කඩයි


වැටෙන ජම්බු අහුල ගන්න
මල්ලි එතන බලා සිටියි
වැටුණු ජම්බු අහුලා ගෙන
මල්ලි හණික ගෙදරට යයි.

(පොදු ගුරු මාර්ගෝපදේශය - 3 ශ්‍රේණිය)


***ක්‍රියාකාරකම 2***

- **ඉහත කවියේ සඳහන් ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වෙන් කර ලියන්න.**

**ප්‍රාණවාචී නාම පද**



### අප්‍රාණවාචී නාම පද




**ක්‍රියාකාරකම 3**

- **පහත ඡේදය කිහිපවරක් කියවන්න.**

ඈත මුහුදේ නැවක් නැංගුරම් ලා තිබුණි. ගුරුතුමිය නැවේ කුඹ ගහ මුදුනේ වැනෙන කොඩිය ළමයින්ට පෙන්නුවා. ධීවර බෝට්ටු වෙරළේ තැනින් තැන නවත්තලා. දැල් ආම්පන්න තව තැනක ගොඩ ගහලා. වෙළෙන්දෝ මාළු තෝරනවා. ලොකු ම ලොකු මාළු කූරියෝ රිදී පාටින් දිලිසෙනවා. උදේට වෙරළ හරි ම කලබල යි. මුහුදු ගිහින් ආ ධීවර පිරිසක් ළමයින්ට අත වැනුවා.



අන්තර්ගතය : උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ටී.ඒම්.ජී දුලාන් සංජීව, නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය


ක්‍රියාකාරකම 4

- *පේදයේ සඳහන් ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වෙන් කර ලියන්න.*

**ප්‍රාණවාචී නාම පද -**




**අප්‍රාණවාචී නාම පද -**



**ක්‍රියාකාරකම 5**

- **පහත සඳහන් ප්‍රාණවාචි හා අප්‍රාණවාචී නාම පද යොදා වාක්‍ය ලියන්න.**

| | | | |
|---|---|---|---|
| සිංහයා | තරුව | විදුහල්පතිතුමා | අහස |
| කොකා | පොත | මිදුල | ගොවියා |

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ..........................................................................................................................
6. ..........................................................................................................................
7. ..........................................................................................................................
8. ..........................................................................................................................


අන්ර්තගතය : උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ටී.ඒම්.ජී දුලාන් සංජීව, නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය